# දේව දයාවේ බැතිය




ජේසුනි මම ඔබ කෙරෙහි විශ්වාස කරමි

# දේව දයාවේ මාවත

ජේසුස් වහන්සේ ශුද්ධවූ පවුස්තිනා තුමියට කළ අනාවරණයන් ඇතුළත් දින පොත් ඇගේ මරණින් පසුව ප්‍රසිද්ධ කරන ලදී. ඒ පිළිබඳව කරුණු පරික්ෂා කිරිම සඳහ දෙවන ජුවාම් පාවුළු පාප්තුමන් විසින් දේව් ධර්මාචාර්යවරයකු වූ කැනන් ඉග්නාසි රොසිකි තුමන්ව පත් කරන ලදී. එතුමන්ගේ නිරීක්ෂණවලට අනුව මෙම දේව දයාවේ මංගල්‍යය දින දී ක්‍රිස්තුන්වහන්සේ ඉමහත් වරප්‍රසාද රැසක් පොරොන්දු වී ඇති බවත් ඒවා සමාන කළ හැක්කේ බෞතීස්ම ස්නාපනයේදී ලැබෙන වරප්‍රසාදයන්ට පමණක් බවත් පවසා ඇත.

## ශුද්ධවූ පවුස්තිනා තුමියගේ දින පොතේ සඳහන් පරිදි ( දේව දයාවේ ප්‍රතිරූපය )

1931 පෙබරවාරි 22 වන දින මම මගේ කුටියෙහි දී සුදු වස්ත්‍රයකින් සැරසුණු ජේසු තුමා දර්ශනය කළෙමි.උන්වහන්සේගේ එක් අතක් ආශීර්වාද කරන ඉරියව්වෙන් ඉහළට එසවී තිබුණු අතර අනික අත පපුව මත වස්ත්‍රය ස්පර්ශ කරන අයුරින් විය. වස්ත්‍රයට යටින් රක්ත වර්ණ ආලෝක දහරා දෙකක් විහිදිණි. මා නිශ්චලව එතුමන් දෙස බලාගත් වනම සිටියෙමි. සැණෙකින් මගේ හද තැති ගත් අතර මහත් සතුටක් ද දැනිණි.නිමේෂයකින් මා ඇමතු ජේසුස් වහන්සේ, ''ඔබ දකින දර්ශනයට අනුව ප්‍රතිරූපයක්

පින්තාරු කරන්න. එහි පහතින්, 'ජේසුනී මම ඔබ කෙරෙහි විශ්වාස කරමි! ' යන්න සඳහන් කරන්න. ප්‍රථමයෙන් ඔබගේ මෙම කුඩා දෙව්මැඳුරේ ද අනතුරුව මුළු ලොවෙහි ද එම ප්‍රතිරූපයට ගරු බුහුමන් කරනු දකින්නට මම ආශා වෙමි. ''

''මෙම ප්‍රතිරූපයට ගෞරවය දක්වන කිසිවෙකු විනාශ නොවන බවට මම පොරොන්දු වෙමි. ඔහුට මෙලොවදීත් විශේෂකොට මරණ මොහොතේදීත් සතුරන්ගෙන් ජයග්‍රහණ ලබා දෙන බවටත් මම තවදුරටත් සහතික වෙමි. මගේම මහිමය ලෙස සලකා මම ඒ ආත්මය ආරක්ෂා කරමි.''

## දේව දයාවේ ප්‍රතිරූපය සහ මංගල්‍යය

දේව දයාවේ මංගල්‍යයක් පැවැත්වීම මගේ ආශාවයි. මෙම ප්‍රතිරූපයට පින්සලකින් පින්තාරු කර පාස්කුවෙන් පසු පළමු ඉරුදින උත්කර්ෂවත් ලෙස ආසිරි ගැන්වීම මට අශ්‍යයි. මෙම ඉරුදින දේව දයාවේ මංගල්‍යය විය යුතුයි.

''මගේ දියණිය, මගේ පුදුමකාර ( සිතා ගන්නට බැරි ) දයාව ගැන මුළු ලොවට කියන්න. මගේ දයාවේ මංගල්‍යය සෑම ආත්මයකටම විශේෂයෙන් අසරණ පවුකරුවන්ට සරණය ද රක්ෂස්ථානයක් ද වීම මගේ ආශාවයි. එදින මගේ දයාවේ ගැඹුරුතම පත්ල විවෘතවනු ඇත. මගේ දයා උල්පත

කරා ළඟාවන ආත්මයන්ට වරප්‍රසාද සාගරයක් මම වස්වන්නෙමි. පාපොච්චාරණය කොට ( සමගි සන්ධානයේ සක්‍රමේන්තුව ලබා ) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගන්නා ආත්මයන් පාපයෙන් සහ දණ්ඩණයෙන් මුළුමනින්ම සමාව ලබනු ඇත. දේව වරප්‍රසාද ගලා එන සියලූම මාර්ග එදින විවෘතවනු ඇත

එබැවින් ලාක්ෂ මෙන් රන්පැහැයෙන් මෙන් පාපයන් සහිතව සිටින අයද අන් සෑම ආත්මයක්ම ද මා වෙතට එන්නට බිය විය යුතු නැත. මගේ දයාව මානුෂිකවූ සහ දේව දූතිකවූ කිසිදු ප්‍රඥාවකට වටහා ගත නොහැකි එකකි.

# දයාවේ ක්‍රියාවන්

මට ඇති ආදරය ඉස්මතු කරන දයාවේ ක්‍රියාවන් මම ඔබෙන් ඉල්ලා සිටිමි. ඔබ සැමවිටම සෑම සැමතැනකදීම ඔබේ අසල්වැසියනට දයාව පෙන්විය යුතුය. මෙය මගහරින්නට හෝ මෙයින් මිදීමට හෝ උත්සාහ නොකළ යුතුයි.

ඔබේ අසල්වැසියා කෙරෙහි දයාව දක්වන මාර්ග 3ක් මම ඔබට දෙමි. පළමු ක්‍රියාවෙන් යන දෙවනුව වචනයෙන් යන තෙවනුව යාච්ඤාවෙන් ය; මෙම තුන් ආකාර ක්‍රියාවන් දයාවෙන් පිරිපුන්ව ඇත. එය මට ඇති ආදරයේ සළකුණක් වනු නොඅනුමාකය. මෙයින් අදහස් කරන්නේ ආත්මයන් මගේ දයාව කෙරෙහි මහිම ප්‍රශංසාව සහ ගෞරව දැක්වීම වන්නේ ය.

# දේව දයාවේ උතුම් පැය ප.ව.3.00

''සවස 3.00ට විශේෂයෙන් පව්කරුවන් වෙනුවෙන් මගෙන් දයාව අයදින්න. මගේ දුක්ප්‍රාප්තියෙහි විශේෂකාරයෙන් මා අත්හැර දමනු ලැබූ දුක් සාගරයෙහි ගිලෙන්න. එය මුළු ලෝකයටම දයාවේ උතුම්ම පැය වන්නේ ය. මගේ මරණීය වේදනාවට ඇතුළුවන්නට මම ඔබට ඉඩ හරිමි. එම පැයේදී මගෙන් ඉල්ලන දෙයක් දෙවියක් වහන්සේගේ අභිමනයට එකඟ න්නේ නම් මම එය ප්‍රතික්ෂේප නොකරමි.''

( ඉහත සඳහන් වන්නේ කිසිදු එකතු කිරීමක් හෝ විස්තර කිරීමකින් තොරෙව ශුද්ධවර වුස්ත්නා මුනිවරියගේ දින පොත්වලින්ම ගත් උපුටනයන් ය. )

භාග්‍යවත් පවුස්තිනා තුමිය ශුද්ධවරයට ඔසොවන ලද 2000 වසර සිට සෑම වර්ෂයකම පාස්කු ඉරුදිනට පසු පැමිණෙන ඉරුදින දේව දයාවේ මංගල්‍යය උත්සවාකාරයෙන් පවත්වනු ලැබේ. ඒ අනුව එම මංගල්‍යයන්

2003 වසරේ අප්‍රියෙල් මස 27 දිනට
2004 වසරේ අප්‍රියෙල් මස 18 දිනට
2005 වසරේ අප්‍රියෙල් මස 03 දිනට යෙදී ඇත.

මංගල්‍යයට පෙර දින 9ක් මෙම මල්දම උච්චාරණය කරන ලෙස ස්වාමින් වහන්සේ මට වදාළ සේක. '' එය මහ සිකුරාදා ආරම්භ කරන්න. මෙම නුවානය තුළින් මම හැකි සෑම වරප්‍රසාදයක්ම ආත්මයන්ට වස්වාලමි. ''

# දයාව කෙරෙහි පවුස්තිනා තුමියගේ නුවාවය

දේව දයාව වෙත මෙම නුවානය ඔබට කළ හැක. නමුත් මංගල්‍යයට පෙර සූදානම් වීමේ නුවානය ලෙස කළ යුත්තේ, ජපමාලය භාවිතයෙන් කරන නුවානයය. මෙම නුවානය ගන්නේ දෙවන තැනය.

'' මහ සිකුරාදා පටන්ගෙන මංගල්‍යයට පෙර නව දිනක් කරන ලෙස, මට උපදෙස් දුන් ජේසුතුමා එ යමට ලියාගන්ට සැළැස්වූහ. ''

පවුස්තිනා තුමිය අප සමිඳුන්ගේ වචන මෙසේ වාර්තා කළාය.

**'' ඔබ විසින් ආත්මයන් මගේ දයාවේ උල්පත කරා ගෙන ඒම සඳහාද එමගින් ඔවුන් ශක්තිය ද සැනසීම ද ජීවිතයේ දුෂ්කරතාවයන්හි ද අවශ්‍ය සියළුම වරප්‍රසාද ද විශේෂයෙන් මරණාසන්න මොහොතේ දී වරප්‍රසාද ද ලබාගැනීම සඳහා ද මෙම නව දින තුළ ඔබගෙන් මම පතමි. ''**

**'' ඔබ, හැම දිනකදීම විවිධ ආත්මයන් කණ්ඩායම් මගේ හදවත කරා ගෙන ඇවිත් මගේ දයා සයුරේ ඔවුන් ගිල්වන්න. මෙම සියළු ආත්මයන් මගේ පියාණන්ගේ ගෘහයට මම ගෙන යමි. ''**

**'' මගේ තික්ත දුක්ප්‍රාප්තියේ ශක්තියෙන් මෙම ආත්මයන්ට වරප්‍රසාද ලැබෙන පිණිස එක එක දින ඔබ මගේ පියාණන්ගෙන් යැදිය යුතුය. ''**

# දෙවිඳුන්ගේ දයාවේ නුවානය

1. සුදුසු ගීයක් ගායනා කිරීම
2. ප.ව. 3ට නියමිත යැදුම
3. දයාවේ මල්දම උච්චාරණය
4. පාද නමස්කාරය
5. නුවාන යැදුම
6. ශු. පවුස්තිනා තුමියගේ ප්‍රශංසාව
7. ගීයකින් නිම කිරීම

# සවස 3.00 ට කරන යැදුම

ජේසු සමිඳාණෙනි, ඔබවහන්සේ උකුත් වූ සේක. එනමුදු ජීවනයේ උල්පත ආත්මයන් වෙත ගලායමින් ඔබවහන්සේගේ කරුණා සාගරය මුළු ලෝකයටම විවෘත කළ සේක. ජීවනයේ උල්පතෙනි, ඔබවහන්සේගේ අපරිමිත කරුණාවෙන් මුළු ලෝකය වැළඳගෙන ඔබව අප වෙත හිස් කළ මැනව.

කරුණාවේ උල්පත වන ක්‍රිස්තුන් වහන්සේගේ දිව්‍ය හෘදය තුළින් අප උදෙසා වැහුණු රුධිරය සහ ජලයෙනි, මම ඔබවහන්සේ කෙරෙහි විශ්වාසය තබමි.
( 3 වරක් )

# දේව දයාවේ මල්දම

**කුරුසියට :** ස්වර්ගයේ වැඩ සිටින.......

**කුඩා ඇට තුනට :** නමෝ මරිය .......

විශ්වාස ලක්ෂණය

## සෑම පන්තියකටම පෙර ලොකු ඇටවලට

සදාකාලික පියාණෙනි, ඔබවහන්සේගේ අති ප්‍රේමණීය පුත්‍රයාණන් ද අපගේ ස්වාමින් ද ගැළවුම් කාරයාණන් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී රුධිරය ද ආත්මය හා දෙවීකය ද,

**පිළිතුර :** අපගේ හා මුළු ලෝකයාගේ පාපවලට වන්දි

වශයෙන් ඔබවහන්සේට ( මම/අපි ) ඔප්පු

( කරමි/කරමු ).

## සෑම පන්තියකම කුඩා ඇටවලට

ජේසු තුමන්ගේ අතිකඨුර වූ දුක්ප්‍රාප්තිය මගින්,

**පිළිතුර :** අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව.

# මල්දම අවසානයේදී ( තුන් වරක් )

ශුද්ධවූ දෙවියන් වහන්ස,

ශුද්ධවූ සර්වබලධාරීන් වහන්ස,

ශුද්ධවූ අමරණීයාණන් වහන්ස,

**පිළිතුර** : අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව.

# අවසන් යැදුම

සදාතන දෙවිඳුනි,

කිසිදින නොසිඳෙන දයානුකම්පාවේ නිධානය වන අනන්ත කරුණාබර ස්වාමිනී, අප දෙස දයාවෙන් බලා, ඔබවහන්සේගේ කරුණාව අප තුළ වැඩි වර්ධනය කළ මැනව. අපගේ කරදර හා කම්කටොළුවලදී කලකිරීමට සහ අධෛර්යය වීමට ඉඩ නුදුන මැනව. මහත් බලාපොරොත්තුවකින් යුතුව ආදරය හා කරුණාව වන ඔබවහන්සේගේ ශුද්ධවූ කැමැත්තට අපි භාර වෙමු. ආමෙන්.

# දේව දයාවේ පාද නමස්කාරය

සෑම පාදනමස්කාර ස්ථානයක්ම ආරම්භයේදී මෙම යැදුම උච්චාරණය කරන්න.

**මූලිකයා** : සදාකාලික පියාණෙනි, ඔබවහන්සේගේ අති ප්‍රේමණීය පුත්‍රයාණන් ද, අපගේ සවාමීන් ද, ගැළැවුම්කාරයාණන් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරිරය හා රුධිරය ද ආත්මය හා දෙවීකය ද,

**සියල්ලෝ** : අපගේ හා මුළු ලෝකයාගේ පාපවලට වන්දි වශයෙන් ඔබවහන්සේට මම ඔප්පු කරමි.

# පළමුවන ස්ථානය

**ජේසුස් වහන්සේ මරණයට තීන්දු කරනු ලැබූ සේක.**

**මූලිකයා** : සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ** : අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම** : .....

යැදුම : අති මෘදු වූද කිසිදු මැසිවිල්ලකින් තොරවූද මාගේ ජේසුනී, පැමිණෙන පාප පරීක්ෂාවලින් මිදෙන්නට මට ඉගැන්නුව මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකටුර වූ දුක්ප්‍රාප්තිය මගින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව.

ආමෙන්.

## දෙවන ස්ථානය

### ජේසු සමිඳාණෝ ජුදයින් විසින් සිය කරපිට තැබූ කුරුසිය සතුටින් වැළඳගත් සේක.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම :** .....

**යැදුම :** මාගේ ආදර ජේසුනී, මේ කුරුසිය ඔබවහන්සේගේ නොවෙයි. එය මගේ ම විය යුතුයි. ඔබව ඇණගැසුවේ මාගේ පාපයයි.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකටුර වූ දුක්ප්‍රාප්තිය මගින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව.

ආමෙන්.

# තුන්වන ස්ථානය

## ජේසු ස්වාමිදරුවෝ කුරුසියේ බරින් පළමුවෙනි වර බිම වැටෙන සේක.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම :** .....

**යැදුම :** මාගේ ජේසුනී, ඔබවහන්සේගේ පළමු වැටීම හේතුකොටගෙන කිසිම පාපයකින්, විශේෂකොට මරණීය පාපයකින් ඇද වැටෙන්නට කිසි දිනෙක මට ඉඩ නුදුන මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකයුර වූ දුක්ප්‍රාප්තිය මඟින්, අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

# හතරවන ස්ථානය

## ජේසු ස්වාමිදරුවන්ට උන්වහන්සේගේ පිරිසිදු මෑණියෝ සම්මුඛ වන සේක.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම : .....**

**යැදුම :** මාගේ ජේසුනී, කොතරම් මානුෂික සමීප බැඳීමකින්වත් ඔබවහන්සේගේ කුරුසියේ අනුගාමිකත්වයෙන් ඉවත් වන්නට මට ඉඩ නුදුන මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකයුර වූ දුක්ප්‍රාප්තිය මඟින්, අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

## පස්වන ස්ථානය

### කුරුසිය ගෙන යන පිණිස සීමොන් සිරනේවුස් ජේසු ස්වාමිදරුවන්ට උදව් වෙයි.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම : .....**

**යැදුම :** මාගේ ජේසුනී, අකැමැත්තෙන් වුවද සීමොන් සිරනේවුස් ඔබට සහය වුනාක් මෙන් මගේ දුක් වේදනා ඔබ වෙනුවෙන් ඉවසීමෙන් දරාගන්නට මට පිහිට වුව මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකටුක වූ දුක්ප්‍රාප්තිය මගින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

## හයවන ස්ථානය

### වෙරෝනිකා නම් භක්තිවන්ත ස්ත්‍රී ජේසු ස්වාමිදරුවන්ගේ ශ්‍රී මුහුණ මණ්ඩලය පිස දමයි.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම :** .....

**යැදුම :** දයාවන්ත ජේසුනී, ඔබවහන්සේ ඔබ ප්‍රතිරූපය

වෙරෝනිකාගේ පිසුම්කඩෙහි තැන්පත් කළාක්

මෙන් මාගේ හෘදයෙහි ද නොමැකෙන ලෙසින්

සනිටුහන් කළ මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකටුක වූ දුක්ප්‍රාප්තිය මගින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

## හත්වන ස්ථානය

### ජේසු ස්වාමිදරුවෝ කුරුසියේ බරින් දෙවනවර බිම වැටෙන සේක.

**මූලිකයා** : සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ** : අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම** : .....

**යැදුම** : ඔබවහනිසේගේ දෙවෙනි වැටීම හේතුකොට ගෙන, යළි යළිත් පාපයට වැටෙන්නට ඇති ප්‍රස්තාවන්ගෙන් මා වැළැක්වුව මැනව.

**සියල්ලෝ** : ජේසු තුමන්ගේ අතිකර්‍ශුර වූ දුක්ප්‍රාප්තිය මඟින්, අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

## අටවන ස්ථානය

### ජේසු ස්වාමිදරුවෝ ජෙරුසලමේ ස්ත්‍රීන් සනසා වදාරණ සේක.

**මූලිකයා** : සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ** : අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම :** .....

**යැදුම :** ජේසුනී, මාගේ ලොකුම සැනසිල්ල වන්නේ, ' ඔබ බොහෝ ආදරය කළ නිසා ඔබේ පව් කමා කළ සේක ' යන ඔබවහන්සේ වදාළ වදන් ඇසීමයි.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකයුර වූ දුක්ප්‍රාප්තිය මගින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

## නවවන ස්ථානය

### ජේසු ස්වාමිදරුවෝ කුරුසියේ බරින්

### තුන්වෙනි වර බිම වැටෙන සේක.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම :** .....

**යැදුම :** ආදර ජේසුනී, මගේ ජීවිත ගමනේ වෙහෙසට

පත්වන විට නොපසුබටව සිටින්නට ඔබවහන්සේ

මට ශක්තිය වුව මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකයුර වූ දුක්ප්‍රාප්තිය මගින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

# දසවන ස්ථානය

## දුෂ්ඨ ජුදයෝ ජේසු ස්වාමිදරුවන්ගේ වස්ත්‍ර කඩා දමති.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම :** .....

**යැදුම :** ආදර ජේසුනී, මාගේ ආත්මය අහිංසකත්වයේ සළුව නැතිකරගෙන ඇත. වන්දි ගෙවීමේ ද පශ්චාත්තාපයේ ද සළුවෙන් මා සැරසුව මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකටුර වූ දුක්ප්‍රාප්තිය මඟින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

# එකොළොස්වන ස්ථානය

## ජේසු ස්වාමිදරුවෝ කුරුසියේ ඇණ ගසනු ලබන සේක.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම : .....**

**යැදුම :** ඔබවහන්සේ ඔබගේ සතුරන්ට කමා කළ සේක. මාගේ දෙවිඳුනි, තුවාල අමතක කර සතුරාට සමාව දෙන්නට මට ඉගැන්නුව මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකයුර වූ දුක්ප්‍රාප්තිය මගින්, අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

## දොළොස්වන ස්ථානය

**ජේසු ස්වාමිදරුවෝ කුරුසියෙහි උකුත් වන සේක.**

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම : .....**

**යැදුම :** ජේසුනී, ඔබවහන්සේ උකුත් වන සේක. එහෙත් ඔබවහන්සේගේ දිව්‍ය හෘදයේ ගැස්ම තවමත් ඔබේ පව්කාර දරුවන් කෙරෙහි වන්නේය.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකටුක වූ දුක්ප්‍රාප්තිය මඟින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

## දහතුන්වන ස්ථානය

### ජේසු ස්වාමිදරුවෝ කුරුසියෙන් බාන ලදුව තමන් වහන්සේගේ පිරිසිදු මෑණියන්ගේ උකුලෙහි පුනවනු ලබන සේක.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම :** .....

**යැදුම :** වික්ෂෝප මෑණියෙනී, ඔබවහන්සේගේ හස්තවලට මා භාරගත මැනව. මගේ පාපවලට පූර්ණවන්දි ගෙවීමනට මා යොමු කළ මැනව. මට ද මුළු ලෝකයාටද දයාවන ලෙසින් ඔබ පුතණුවන් ඉදිරියේ යචේඤා කළ මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකටුක වූ දුක්ප්‍රාප්තිය මඟින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

# දහහතරවන ස්ථානය

## ජේසු ස්වාමිදරුවෝ ගල්ලෙනෙහි තැන්පත් කරනු ලබන සේක.

**මූලිකයා :** සදාකාලික පියාණෙනි.......

**සියල්ලෝ :** අපගේ හා මුළු ලෝකයාගේ........

**මෙනෙහි කිරිම :** .....

**යැදුම :** ආදර ජේසුනී, දිව්‍ය ෂත්ප්‍රසාදයෙන් ඔබවහන්සේ මා වෙත කඨින කල මගේ හෘදය ඔබවහන්සේගේ වන්දනීය සීරුරට ඔබින වාසස්ථානයක් බවට පත් කළ මැනව.

**සියල්ලෝ :** ජේසු තුමන්ගේ අතිකඨුර වූ දුක්ප්‍රාප්තිය මඟින්,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව. ආමෙන්.

## අවසානය (තුන් වරක්)

ශුද්ධවූ දෙවියන් වහන්ස,

ශුද්ධවූ සර්වබලධාරීන් වහන්ස,

ශුද්ධවූ අමරණීයාණන් වහන්ස,

අපටත් මුළු ලෝකයාටත් දයාවුව මැනව.

(පිටු අංක 8 හි අවසාන යැදුම කියන්න.)

# නුවාන යුදුම්

## පළමු දිනය

මුළු මනුෂ්‍ය ජාතිය උදෙසාත්, විශේෂයෙන් පව්කාරයන් උදෙසාත්,දෙවිඳුන් ගේ දයාව අයදිමින් අපි යාච්ඤා කරමු.

අපට දයාව පෙන්වා/ අපේ පව් කමා කරන්නාවූ/ අති කරුණා හරිත ජේසුනී/ අපගේ පාපයන් දෙස නොව/ අප ඔබගේ/ අසීමිත යහපත කෙරෙහි/ තබන්නා වූ විශ්වාසය දෙස/ බැලුව මැනව./ අප සැම/ ඔබගේ දයාභරිත හදවතෙහි/ රඳවා ගත මැනව./ සදාකාලයටම/ එයින් ඉවත්ව යෑමට/ අපට ඉඩ නුදුන මැනව./ මෙකීදේ/ ඔබ හාපියාණන් වහන්සේ ද/ ශුද්ධාත්මයාණන් වහන්සේ ද/ සම්බන්ධ කරන්නා වූ/ ප්‍රේමයේ සහ අති පරිශුද්ධ වූ/ අභිරස්මය වූ ශුද්ධ වූ ත්‍රිත්වයේ/ ඒකත්වය උදෙසාම/උදක් ම ඉල්ලා සිටිමු.

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/මුළු මහත් මනුෂ්‍ය ජාතියේත්/විශේෂකොට/අසරණ පව්කාරයන් ගේත්/එකම බලාපොරොත්තුව වන/ අපගේ ස්වාමීන්ද,/ ඔබගේ පුත්‍රයාණන් ද වන/ ජේසුස් ක්‍රිස්තුස් තුමන් ගේ/ අති දයාභරිත වූ/ දිව්‍ය හෘදය නිසා,අප සැම දෙස/ කරුණාවෙන් බැලුව මැනව./ සදාකල්හිම/ ඔබවහන්සේගේ සර්ව බලධාරිත්වයට/ ප්‍රශංසා කරනු පිණිස/ ජෙසුතුමන්ගේ කධුරවූ/ වද ගාවිනා හේතුකොට ගෙන/ ඔබ වහන්සේගේ කරුණාව/ අපට ලැබේවා./ ආමෙන්.

(ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න.)

(පිටු අංක 33)

## දෙවන දිනය

දෙවිඳුන්ගේ දයාව මුළු මහත් මනුෂ්‍ය වර්ගයා වෙතම ගලා යන මාර්ගය වූ පැවදි, පූජක උතුමන් උදෙසා අපි යාච්ඤා කරමු.

සියලු යහපතේ උල්පත වන/ අති කරුණා භරිත වූ ජේසුනී/ සදාකල්හිම නිසි අයුරින්/ දෙවිඳුන්ගේ දයාවේ බැතිය/ වඩනු සඳහා/ වචනයෙනුත්, ආදර්ශයෙනුත්/ ඔබ වහන්සේගේ මිදි උයනේ/ කරන කාර්යයන්/ අගනා ලෙසත්/ පලභරිත ලෙසත් කිරීමට/ පැවදි හා පූජක උතුමන්ට ඔබගේ ආසිරි/ වස්වා වදාළ මැනව./

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/ ඔබගේ පුත්‍රයාණන්ද,/ අපගේ ස්වාමින්ද වන/ ජේසුස් ක්‍රිස්තුස් තුමන්ගේ/ විශේෂ ආදරයට භාජනය වූ/ ඔබ වහන්සේගේ මිදි උයනේ සේවය කරන/ පැවදි හා පූජක උතුමන්ගේ/ ආත්මයන් දෙස දයාවෙන් බැලුව මැනව./ ඔබගේ ආසිරි බලයෙන්/ ඔවුන්ට වරප්‍රසාදයන්/ දානය කළ මැනව./ ඔබගේ දයා කරුණාව නිසා/ දෙනු ලබන/ ගැලවීමේ මාර්ගය කරා/ විශ්වාසිකයන් නිසි ලෙස/ ගෙන යෑම සඳහා/ ඔවුන්ට ආලෝකය දුන මැනව./ ආමෙන්.

( ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න. )

(පිටු අංක 33)

## තුන්වන දිනය

සියලුම ක්‍රිස්තියානි විශ්වාසකයින් උදෙසා අපි යාච්ඤා කරමු.

දෙවිඳුන්ගේ දරුණා නිධානයෙන්/ අප වෙත නිරන්තරවම/ ආසිරි වස්වා වදාරන්නාවූ/ කරුණා හරිත ජේසුනී/ සියලුම ක්‍රිස්තියානි විශ්වාසකයින්/ ඔබගේ කරුණා හරිත හෘදය තුළ / රඳවා ගත මැනව./ අපට එයින් ඉවත්වීමට/ කිසි දිනක ඉඩ නුදුනු මැනව./ දෙවිපියාණන්

හා ශුද්ධාත්මයාණන්/ ඔබ සමග එක් කරවන්නාවූ/ ප්‍රේමය තුළින්ද/ ශුද්ධවූ ත්‍රිත්වයේ නාමයෙන්ද,/ අපි මෙය උදක්ම ඉල්ලා සිටිමු.

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/ ඔබගේ පුත්‍රයාණන්ගේ/ දුක් ගාවිනා හේතු කොට ගෙන,/ එතුමන්ගේ උරුමකරු වන්නාවූ/ විශ්වාසිකයින් වෙත/ ඔබගේ ආසිරි/ වස්වා වදාළ මැනව./ කිසි දිනක අඩු නොවන/ ඔබගේ සුරැකුම තුළ / ඔවුන් ආරක්ෂා කළ මැනව./ සත්‍ය විශ්වාසය කෙරෙහි/ ඔවුන් තුළ ඇති/ ආදරය හා ගෞරවය/ කිසි දිනක/ අඩු නොවන ලෙසත්/ සුරදූතයන් හා සාන්තුවරයන් සමග/ සදාකල්හි ඔබගේ අප්‍රමාණ දයාව/ ප්‍රශංසා කිරිමට හැකි වන ලෙසත්,/ ඔබගේ ආසිරි ඔවුන් වෙත දානය කළ මැනව./ ආමෙන්.

( ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න. )

(පිටු අංක 33)

# හතරවන දිනය

දෙවිඳුන්ගේ දයාව ගැන තවමත් නිසි දැනුමක් නැති මිථ්‍යාදෘෂ්ටිකයන් හා අවිශ්වාසිකයන් උදෙසා අපි යාච්ඤා කරමු.

අති කරුණාභරිතවූ ජේසුනී/ ලෝකයේ ආලෝකයෙනි;/ ඔබ වහන්සේ ගැන/ තවමත් නිසි දැනුමක් නැති මිථ්‍යාදෘෂ්ටිකයන් හා අවිශ්වාසිකයන්ගේ ආත්මයන්/ ඔබගේ කරුණාභරිත හෘදය තුළට/ එක් කරගත මැනව. ඔවුන් අප සමග එක්වී/ ඔබගේ කරුණාවේ ආශ්චර්යයන් ගැන/ ප්‍රශංසා කිරීමට හැකිවන ලෙස/ ඔවුන්ගේ හදවත්/ ඔබගේ වරප්‍රසාදයේ රශ්මියෙන්/ ආලෝකමත් කළ මැනව.

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/ ඔබ පුත්‍රයාණන් හා අප ස්වාමින් ද වන/ ජේසුස් ක්‍රිස්තුස් තුමන්ගේ/ අති දයානුකම්පාභරිත දිව්‍ය හෘදය ගැන/ තවමත් නොදන්නාවූ/ මිථ්‍යාදෘෂ්ටිකයන් හා අවිශ්වාසිකයන් දෙස/ දයාවෙන් බැලුව මැනව./ ඔබට ආදරය කිරීමෙන්/ ලබන්නා වූ ප්‍රීතිය කොතරම් මහත්ද යන්න/ ඔවුන් අවබෝධ කර ගනු පිණිසත්/ නිරතුරු ඔබගේ දයාව/ මහිමයට පමුණුවනු පිණිසත්,/ සුවිශේෂයේ ආලෝකය වෙතට/ ඔවුන් ළං කර ගත මැනව./ ආමෙන්.

( ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න. )

(පිටු අංක 33)

# පස්වන දිනය

විශ්වාසය සම්බන්ධයෙන් වැරදි මත දරන්නන් උදෙසා අපි යාච්ඤා කරමු.

බැගෑ සිතින්/ ඔබගේ ආලෝකය ඉල්ලන කිසිවකු/ ප්‍රතික්ෂේප නොකරන/ අති යහපනාණන් වූ කරුණා භරිත ජේසුනී/ විශ්වාසය සම්බන්ධයෙන්/ වැරදි මත දරන්නන් ගේ ආත්ම/ ඔබගේ මහා කාරුණික හෘදය තුළට/ ළං කරගත මැනව./ ඔබගේ ආලෝකයෙන්/ ශුද්ධ වූ සභාවේ ඒකත්වය තුළ/ ඔවුන් ඒකරාශීකර/ ඔබගේ ත්‍යාගශීලි භාවය ගැන/ අපත් සමග එකතුවී/ සදා කාලයටම ප්‍රශංසා කිරිමට/ ඔබගේ ආලෝකයේ රැස්/ ඔවුන් වෙත / වස්වා වදාළ මැනව.

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/ තමන්ගේ වැරදි මතවලම පිහිටා/ මුරණ්ඩු ලෙස/ ඔබගේ වරප්‍රසාද කෙළෙසමින්/ එම නිධානයන්/ විනාශ කරන විට වුවත්,/ නොමග ගිය මේ ආත්ම වෙත/ දයාවෙන් බැලුව මැනව./ ඔවුන්ගේ දුෂ්ටකම් නො සැලතුව මැනව./ ඔබගේ පුත්‍රයාණන්ගේ ප්‍රේමණීය දුක්ප්‍රාප්තියට පෙර/ ඔවුන් සියල්ලන් එක් කෙනෙකු වන පිණිස/ ඔබ වහන්සේ ගෙන් කරන ලද අයැදුම සලකා/ මෙම

ආත්මයන්/ ආශීර්වාද ලත් එකමුතුවට හැකි ඉක්මණින් ආපසු පැමිණ/ බැතිමත් අප සමග/ සාදකාලයටම ඔබ වහන්සේට ප්‍රශංසා කරනු පිණිස/ ඔවුන්ට වරම් දෙනවා සොඳේ. ආමෙන්.

( ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න. )

(පිටු අංක 33)

## හයවන දිනය

බාලයන් හා බාලයන් වැනි අය උදෙසා අපි යාච්ඤා කරමු.

''මෘදු ගුණය හා හෘදයේ බැහැපත්කම මම වෙමි./ මගෙන් ඉගෙන ගක්කැ''යි/ වදාළවූ අති කරුණා හරිත ජේසුනී;/ ඔබ වහන්සේගේ ස්වර්ගීය පියාණන් වහන්සේ ගේ/ සිංහාසනය අබියස තබා ඇති/ සුගන්ධවත් කිරීටයක් ලෙස/ ස්වර්ගය සසුන්දර කළ/ බාලයන් හා බාලයන් වැනි/ මෘදු හෘදයේ බැහැපත්කම ඇති අයවලුන් ගේ ආත්මයන්/ ඔබගේ කරුණා හරිත හෘදය තුළට/ ළං කරගත මැනව./ ඔවුන් සැම කල්හි/ ඔබගේ දිව්‍යා හෘදය තුළ වසන සැටියටත්,/ දෙවිඳුනගේ දයාව සැම කල්හි/ ප්‍රශංසා කරනු පිණිසත්/ ඔවුන්ට වරම් දෙවා වදාළ මැනව.

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/ ඔබගේ අති ප්‍රේමනීය පුත්‍රයාණන් ලෙස,/ මෘදු ගුණයෙන් හා හෘදයේ බැහැපත් කමින් ජීවත්ව,/ ඔවුන්ගේ යහපත් බවේ සුගන්ධ ය,/ ඔබගේ සිංහාසනය පාමුල තෙක් එසැවූ/ බාලයන් හා මෘදු ගුණය ද හෘදයේ බැහැපත්කමද ඇතිව/ දිවි ගෙවන බාලයන් වැනි අය දෙස/ දයාවෙන් බැලුව මැනව./ දයා හරිත පියාණෙනි,/ මේ ආත්මයන් වෙත/ ඔබගේ ඇති ප්‍රේමය හා/ ඔවුන් වෙත ඔබට ඇති ප්‍රසන්න භාවය සලකා බලා/ අපද මුළු ලෝකයාද ආසිරි ගන්වා/ ඔබගේ නොසිඳෙන දයාවට/ ප්‍රශංසා කිරිමට අපට ශක්තිය දෙන මෙන්/ උදක්ම ඉල්ලා සිටිමු./ ආමෙන්.

( ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න. )

(පිටු අංක 33)

## හත්වන දිනය

දෙවිඳුන්ගේ දයාවට ගෞරව දක්වන්නා වූ ද, ඒ තුළ විශ්වාසය පෝෂණය කරන්නා වූ ද, එමගින් ජේසු තුමන්ගේ අති දයානුකම්පා හෘදයේ ජීවමාන ප්‍රතිරූපයක් බවට පත් වන්නා වූ විශ්වාසිකයන් උදෙසා අපි යාච්ඤා කරමු.

අති කරුණා හරිත ජේසුනී,/ ප්‍රේමයෙන් පිරුණාවූ අති දයානුකම්පිත හෘදය/ ඔබ වහන්සේමය./ දෙවි සමිඳුන්ගේ දයානුකම්පාවට/ ගෞරව කිරිම සඳහා/ විශේෂයෙන් කැපවී

සිටින්නන්ගේ ආත්මයන්/ ඔබගේ හෘදයට භාරගත මැනව./ දෙවි මහෝත්තමයාණන් වහන්සේගේම බලයෙන් පිරි/ නියම ශක්තිය ලබන්නාවූ මෙම ආත්ම/ උන්වහන්සේගේ උතුම් කමට ප්‍රශංසා කරමින්/ මුළු මනුෂ්‍ය වර්ගයාගේම/ දුක් වේදනාවන්ගේ බර බෙදා ගැනීමටත්,/ තද දුක් වේදනා හා/ විපත් ආපදා මධ්‍යයේ වුවද,/ ඔබ වහන්සේ සමගින් එම බර කර තබාගෙන යෑමටත්/ ආශාවෙන් සිටිති./ සදා වර්ධනය වන්නාවූ ඔබ වහන්සේගේ දයානුකම්පාවෙන්/ ඔවුන් එක් කර ගන්නා මෙන්ද,/ චිත්ත ධෛර්‍යය/ ඉවසිලිවන්තකම සහ ස්ථිරත්වය යන/ වරප්‍රසාදයන් ගෙන් ඔවුන් ශක්තිමත් කරන මෙන්ද/ බැගෑ සිතින් අයැද සිටිමු.

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/ ඔබ වහන්සේගේ දයානුකම්පාව,/ විශේෂ සෞම්‍ය ගුණයෙන් ප්‍රශංසා කරන හා/ වන්දනා මාන කරන ආත්මයන් දෙස බලා වදාළ මැනව./ ඔවුන්ගේ දෙතොල් ප්‍රශංසාත්මක ගීතිකාවලින් හා/ දැත් දයානුකම්පාවේ ක්‍රියාවන්ගෙන් පිරී ඇත./ ඔබ වහන්සේ ගේ සදා වැඩි වර්ධනය වන්නාවූ/ දයානුකම්පාව පෙන්වීමට/ කරුණාවෙන් ක්‍රියා කරන මෙන්ද,/ ඔවුන් ඔබ වහන්සේ තුළ තබා තිබෙන බලාපොරොත්තුවට අනුවද/ ඔබ වහන්සේගේ මහිමය ලෙසම/ ඔවුන් ආරක්ෂා කරන

බවට/ ඔබ වහන්සේ දුන් පොරොන්දුව අනුවාද,/ ඔබගේ සැමදා වර්ධනය වන/ දයාවේ අනුග්‍රහය නිති පතාත්/ විශේෂ කොට මරණ මොහොතේ දීත් දානය කළ මැනව./ ආමෙන්.

( ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න. )

(පිටු අංක 33)

## අටවන දිනය

වේදනා විඳිමින් දෙවියන් වහන්සේගේ සාධාරණත්වය ඉටු කරන, ජේසු තුමන්ගේ ශ්‍රී රුධිරයේ කරුණා භරිත ධාරාවන් මගින් එම වේදනා සැහැල්ලු කර අඩු කරන, ශුද්ධිකාග්නි ස්ථානයේ ආත්මයන් උදෙසා අපි යාච්ඤා කරමු.

'' ඔබගේ ස්වර්ගීය පියාණන් වහන්සේ/ දයානුකම්පාවෙන් සිටින්නාක් මෙන්/ ඔබද දයානුකම්පාවෙන් සිටින්නැ'' යි/ වදාළ අති කරුණා භරිත ජේසුනී;/ දෙවි තුමන්ගේ සාධාරණත්වයේ ණය යුක්තිය ඉටු කරමින්/ ශුද්ධිකාගිනි ස්ථානයේ වේදනා විඳින ආත්මයන්/ ඔබගේ ශ්‍රී හෘදය තුළට භාර ගන්නා ලෙස/ අපි ඔබගෙන් ඉල්ලා සිටිමු./ ඔබගේ දිව්‍යමය වූ ශ්‍රී හෘදයෙන්/ ගලා බසින රුධිර හා ජල ධාරාවන්/ ශුද්ධිකාගිනි ස්ථානයේ ගිනි දැල් සිසිල් කර,/ ඔබගේ කරුණාවේ අප්‍රමාණ බලය/ මහිමවත් කරන සේක්වා.

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/ අප ස්වාමින් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ/ දුක්ප්‍රාප්ති යේ වද ගාවිනා මගින් හා/ එම දුක්ප්‍රාප්තියේ දී උන් වහන්සේගේ දිව්‍ය හෘදයට/ දරන්නට සිදුවූ වේදනා උදෙසාද/ දැනට ශුද්ධිකාගිනි ස්ථානයේ/ ඔබගේ සාධාරණශ්වයේ විෂයට හේතුකාරයන් වී සිටින/ ආත්මයන් වෙත අනුකම්පා කර,/ ඔවුන්ගේ වේදනා දෙස දයාවෙන් බැලුව මැනව./ ඔබ වහන්සේගේ දයාබර පුත්‍රයාණන් හා/ අපගේ ස්වාමීන් ද වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ/ තුවාළ උදෙසා ද,/ උන්වහන්සේ ගේ සාධාරණත්වය ඉක්මවා යන්නාවූ/ උන්වහන්සේගේ කරුණාව උදෙසාද/ ඔවුන් දෙස කරුණාවෙන් බලා/ ඔවුන් වෙත අනුකම්පාව දක්වන මෙන්/ අපි ඔබගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිමු./ ආමෙන්.

( ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න. )

(පිටු අංක 33)

# නව වන දිනය

ජෙත්සෙමනි මල් උයනේදී අප ස්වාමීන් වහන්සේ විඳි භයානක දුක් ගාවිනාවලට හේතුවූ ඇමැරුණු සිත් ඇති අය සඳහා අපි යාච්ඤා කරමු.

යහපතාණන් වන දයාවේ ජේසුනී/ ජෙත්සෙමෙනි ඔලිව් උයනේදී/ ජරාපත් වන මෘත ශරිර මෙන්/ අධික පිළිකුලින් හා අප්‍රියතාවයෙන් ඔබ වහන්සේ පිරවූ/ සියලුම ඇල්මැරුණු ආත්මයන්/ ඔබගේ මහ කාරුණික හෘදය තුළට/ ඒමට මග පෙන්වුව මැනව./ දිනෙන් දින වර්ධනය වන උනන්දුවෙන් ජ්වලිත වනු සඳහාත්/ ඔබගේ නිමක් නැති කරුණාව නිරන්තරයෙන් පසසනු සඳහාත්,/ ඔබගේ පවිත්‍රවූ ප්‍රේමය නමැති උණුසුමෙහි ඔවුන් ගිල්වා,/ අති ශීතලවූ ඔවුන්ගේ ඒ උදාසීන බව තුරන් කළ මැනව.

පරමණ්ඩලය...... නමෝමරිය....... ත්‍රිත්ව ස්තෝත්‍රය එක වරක් බැගින් කියන්න.

සදාකාලික පියාණෙනි,/ ඔලිව් උයනේදී ඔබගේ අති කරුණා හරිත පුත්‍රයාණන්ගේ/ වේදනාත්මක ඉල්ලීම වු '' **මේ කුසලාන මගෙන් ඉවත් කළ මැනව** '' යන්න/ ඉටු වන්නට ඉඩ නුදුන් ඇල්මැරුණු ආත්මයන් දෙස දයාවෙන් බැලුව මැනව./ ඔබගේ ප්‍රේම හරිත පුත්‍රයාණන් හා අපගේ

ස්වාමීන් ද වන/ ජේසුස් ක්‍රිස්තුස් තුමන්ගේ වද ගාවිනා උදෙසාත්,/ කුරුසිය මත ගත කළ වේදනා හරිත තුන් පැය උදෙසාත්/ මෙලොවදී යහපත් ක්‍රියා කිරීමටත්/ දෙවි මහෝත්මයාණන් ගේ දයාව ප්‍රශංසා කිරීමටත්,/ ඔබගේ මහිමය සඳහා ඔවුන්ගේ හදවත් තුළ ජ්වලිත භාවය ඇති කරන ලෙසටත්/ සත්‍ය ප්‍රේමයෙන් ඔවුන් හදවත් පුරවන ලෙසටත්,/ අපි ඔබ වහන්සේ ගෙන් අයැද සිටිමු. ආමෙන්.

( ශුද්ධවූ පවුස්තිනා තුමියගේ ප්‍රශංසා කියන්න. )

(පිටු අංක 33)

# ශුද්ධවූ පවුස්තිනා සොයුරියගේ ප්‍රශංසාව

## දේව ප්‍රේමය පුෂ්පයයි - දයාව ඵලයයි.

**දේව දයාව පිළිබඳව සැක ඇතතෝ මෙම කරුණු කියවා විශ්වාස කරත්වා.**

❖ පියාණන් තුළින් ගලා එන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ දෙවිඳුන්ගේ ශ්‍රේෂ්ඨතම ලක්ෂණය වන දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ විශ්මිත අභිරහස වන දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ ශුද්ධවූ ත්‍රිත්වය තුලින් ගලා බසින විශ්මිත අභිරහස වන දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ මානුෂික හෝ දේව දූතික වූ කිසිදු ප්‍රඥාවකට වටහා ගත නොහැකි දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ සදාතන ජීවයද, සතුටද ගලා බසින්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ ස්වර්ගයට වඩා යහපත්වූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ ප්‍රාතිහාර්ය හා ආශ්චර්යයන්ගේ උල්පත වන දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ මුළු විශ්වයම වැළඳගන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ මාංශගතවූ වචනය තෙම තුළ මෙලොවට වැඩම කළාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ ජේසු තුමන්ගේ දිව්‍ය හෘදයේ විවෘත තුවාලය තුළින් ගලා බසින්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ අපවද විශේෂකොට පව්කරුවන්වද ජේසු තුමන්ගේ දිව්‍ය හෘදය තුළ සඟවා ගත්තාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ දිව්‍ය හෘදය තුළ අප හොවා ගැනීමේ නිමාවක් නොමැති දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ ශුද්ධවූ සභාව ස්ථාපිත කිරීම තුළවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ ප්‍රසාද ස්නාපනය නමැති සක්‍රමේන්තුව තුළවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ ජේසු තුමන් තුළින් අප සාධාරණීකරණය කරන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ අපගේ මුළු ජීවිතය තුළම අප සමග සිටින්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ අපගේ මරණ මොහොතේදී අප වැළඳ ගන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ සදාතන ජීවිතය අපහට දානය කරන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ අප ජීවිතයේ සෑම මොහොතකදීම අප සමග වන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමී.**

❖ නිරාගින්නෙන් අප ආරන්ෂා කරන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමී.**

❖ බරපතළ පව් කරුවන්ගේ සිත් හරන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමී.**

❖ සුරදූතයන්ගේ මවිතයද, ශුද්ධවරයන්ගේ ආකූලයද වූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමී.**

❖ දෙවිඳුන්ගේ සියලුම අභිරහස් තුළ තේරුම්ගත නොහැකිවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමී.**

❖ සෑම දුක් ශෝකයකින්මඅප මුදන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමී.**

❖ අපගේ සතුටත් ආනන්දයත් වන දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමී.**

❖ ශූන්‍යත්වයෙන් පැවතීමට අප කැඳවන්නාවූ
දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ තමන්වහන්සේගේ හස්තවලින් නිමවූ සැම දෙයක්ම
වැළඳගන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ දෙවිඳුන්ගේ සෑම උතුම් ක්‍රියාවකම කිරුළ වූ
දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ අප සැම එහි ගිල්වන්නාවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ දුක් ශෝකයෙන් පිරි හදවත් වලට සුව සහනය වන
දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ බලාපොරොත්තු සුන්වූ ආත්මයන්ගේ
බලාපොරොත්තුව වන දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ හෘදයන් තුළ සැනසීමද ත්‍රාසය තුළ සාමයද වන
දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ නිර්මල ආත්මයන්ගේ ආනන්දයත් සතුටත් වන දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

❖ සෑම බලාපොරොත්තුවකටම වඩා ආනුභා සම්පන්නවූ දෙවිඳුන්ගේ දයාවෙනි,
**මම ඔබ වහන්සේ කෙරෙහි විශ්වාස කරමි.**

අසීමිත දයාවෙන් පරිපූර්ණ වූ, විපුල කරුණා නිධානය වූ සදාතනික දෙවිඳුනි, දුෂ්කර මොහොතවලදී බලාපොරොත්තු සුන්කර නොගෙන, අධෛර්යයට පත් නොවී ප්‍රේමයද දයාවද වන ඔබගේ ශුද්ධවූ කැමැත්තට විශ්වාසීවද බලාපොරොත්තුවෙන් ද, කැපවීමට අප වෙත ඔබ වහන්සේගේ දයා බැල්ම හෙලා අප තුළ ඔබවහන්සේගේ දයා කරුණාව වැඩිකර වදාළ මැනව.

අහෝ! තේරුම්ගත නොහැකිවූද අසීමිත වූද දේව දයාවෙනි, ඔබවහන්සේට යෝග්‍ය ලෙස ප්‍රශංසාවත් වන්දනාවත් පුද කළ හැක්කේ කවරෙකුටද?